# බස්නාහිර පළාතේ ප්‍රවාහන, මහාමාර්ග, ක්‍රීඩා, යෞවන හා වනිතා කටයුතු අමාත්‍යාංශයේ ක්‍රීඩා නිලධාරි තනතුරට බඳවා ගැනීමේ පරිපාටිය

අමාත්‍යාංශයේ යොමු අංකය :- ප්‍ර/2/7/2/01
ආණ්ඩුකාරවරයා(බ.ප)ගේ යොමු අංකය :- 01/25/50

වැටුප් පරිමාණය:-

රු.54,480/-න් පටන් ගෙන රු.1320/-වැටුප් වර්ධක 9 කින්ද, 1560/- වැටුප් වර්ධක 8 කින්ද යුක්තව රු.78,840/-දක්වා වැඩිවන වාර්ෂික ඒකාබද්ධ වැටුප් පරිමාණයක් මෙම තනතුරට හිමිවේ. රු.58,440/-හා රු.69,480/-වැටුප් පියවරට පෙර කාර්යක්ෂමතා කඩඉම් වේ.

වයස් සීමාව:-

අවුරුදු 20 ට නොඅඩු හා අවුරුදු 30 ට නොවැඩි විය යුතුය. (රජයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත වූවන් සඳහා උපරිම වයස් සීමාව බලනොපානු ඇත.

අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්:-

(අ) I. දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළ භාෂාව සහ ගණිතය/අංක ගණිතය/වාණිජ අංක ගණිතය ඇතුළුව විෂයයන් 06 කින් අ.පො.ස.(සා.පෙ) විභාගය

හෝ

ඊට සමාන හෝ උසස් විභාගයකින් සමත්ව සිටීම සහ

(ආ) I. පිළිගත් ක්‍රීඩා/ශාරීරික අධ්‍යාපන පාසැලක යටත් පිරිසෙයින් හය මසකවත් ක්‍රීඩා පිළිබඳ පාඨමාලාවක් සාර්ථක ලෙස සම්පූර්ණ කර තිබීම

හෝ

II. යුද/නාවික/ගුවන් හමුදා අභ්‍යාස පාසැලක ක්‍රීඩා/ශාරීරික අධ්‍යාපනය පිළිබඳ පිළිගත් පාඨමාලාවක් සාර්ථක ලෙස සම්පූර්ණ කර තිබීම

හෝ

III. පාසැලක ක්‍රීඩා ගුරුවරයකු/ගුරුවරියක වශයෙන් හෝ පළාත් පාලන ආයතනයක ක්‍රීඩා උපදේශක/උපදේශිකාවක වශයෙන් හෝ යටත් පිරිසෙයින් අවුරුදු 05 ක පළපුරුද්ද තිබීම

හෝ

IV. යම්කිසි ක්‍රීඩා විෂයයක සමස්ථ ලංකා කණ්ඩායමක සාමාජිකයෙක්ව ජාත්‍යන්තර තරඟයකට සහභාගි වී සිටීම.

හෝ

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී
2000.01.31

Secretary to the Governor
Western Province

v. ක්‍රීඩා අමාත්‍යාංශය විසින් පවත්වනු ලබන ජාතික මහා ක්‍රීඩා උළෙලෙහි දිස්ත්‍රික් මට්ටමේ 1, 2 ස්ථාන ලබා තිබීම හෝ ජාතික ක්‍රීඩා සංගම් (ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක:25 දරණ ක්‍රීඩා පනත යටතේ පිහිටුවන ලද) විසින් පවත්වනු ලබන ජාතික මට්ටමේ තරඟවලදී 1,2,3 ස්ථාන ලබා තිබීම.

vi. යහපත් චරිතයකින් යුක්ත විය යුතු අතර, ශාරීරිකවද සුදුසු විය යුතුය.

බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවන් විය යුතුය.

04. බඳවා ගැනීමේ ක්‍රමය:-

ගැසට් නිවේදනයක් මගින් පුරප්පාඩු ප්‍රසිද්ධ කොට අයදුම්පත් කැඳවා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 15/90 විධිවිධාන වලට යටත්ව නියමාකාරයෙන් සංස්ථාපිත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් පවත්වන සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගැනීම් සිදුකෙරේ. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට ක්‍රීඩා ක්ෂෙත්‍රයේ ප්‍රවීනතා ඇති සාමාජිකයින් දෙදෙනෙකු ද ඇතුළත් විය යුතුය.

05. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි:-

මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. තේරා ගන්නා අයදුම්කරුවන් වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

06. සේවා කොන්දේසි:-

ආයතන සංග්‍රහයේ II වන පරිච්ඡේදයේ 12:01 සහ 12:06 සිට 12:12 දක්වා ඇති උප වගන්ති අදාල වේ.

උපලේඛනය: I වන කාර්යක්ෂමතා කඩඉම - වාර්ෂිකව වැටුප රු.58,440/-ට පෙර

දෙපාර්තමේන්තු ලිඛිත පරීක්ෂණයකින් හා වෘත්තිය පරීක්ෂණයකින් සමත් විය යුතුය.

විෂය නිර්දේශය:

(I) ලිඛිත පරීක්ෂණය:

මලල ක්‍රීඩා, වොලිබෝල්, පාපන්දු හා තෝරාගත් තවත් ක්‍රීඩා දෙකක් පිළිබඳ නීතිරීති හා තරඟ පැවැත්වීම පිළිබඳ සාමාන්‍ය දැනීම හා ක්‍රීඩා පනත සහ බස්නාහිර පළාත් ක්‍රීඩා ප්‍රඥප්ති පිළිබඳ දැනුම පරීක්ෂා කෙරේ.

මේ සඳහා ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි පිළිබඳ විෂයයන්ද ඇතුළත් වේ.

(II) දෙපාර්තමේන්තුව පවත්වන වෘත්තිය පරීක්ෂණයක් මගින් ක්‍රීඩා පිළිබඳ දැනීම පරීක්ෂා කෙරේ.

2 වන කාර්යක්ෂමතා කඩඉම - වාර්ෂික වැටුප රු.69,480/- දී

...// 03

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී. [signature]
2000.01.31 Secretary to the Governor
Western Province

2:1 මේ සඳහා ක්‍රීඩා පිළිබඳ පිලිගත් ආයතනයකින් ඩිප්ලෝමා සහතිකයක් ලබා තිබීම සහ ක්‍රීඩා පනත යටතේ පිහිටුවන ලද ජාතික සංගම්වල නිරතයෙකු හෝ පසිද්ධ හෝ පුහුණුකරුවකු හෝ ආරම්භකයෙකු හෝ කාල ගණකයෙකු වශයෙන් සුදුසුකම් ලැබිය යුතුය.

II. අ.පො.ස.(සා.පෙ) විභාගයේදී ඉංග්‍රීසි විෂයයෙන් සාමාර්ථයක් ලබා තිබීම.

මෙම ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති කොන්දේසිවලට අමතරව ආයතන සංග්‍රහ රෙගුලාසිවලටද බස්නාහිර පළාත් සභාවේ මුදල් රෙගුලාසිවලටද කලින් කල බස්නාහිර පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් නිකුත් කරන රෙගුලාසි කොහොත් නියෝග වලටද, බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කලින් කල පනවනු ලබන වෙනත් කොන්දේසිවලටද අනුකූලව ක්‍රියා කිරීමට සියළුම නිලධරයෝ බැඳී සිටිති.

මෙම තනතුරේ සේවය බස්නාහිර පළාත තුළට සීමාවේ.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.

Secretary to the Governor
Western Province

2000.01.31